


# අඛණ්ඩව සිදුවන දියාරු පිතිකරණය දැන්වත් නවතීද?

ශ්‍රී ලංකා ක්‍රිකට් පිල හෙට (දෙසැ:26) බොක්සිං දිනයේ දකුණු අප්‍රිකාව සමග දෙවනි ටෙස්ට් තරගයට සහභාගි වීමට සූදානම් වේ. ප්‍රථම ටෙස්ට් තරගය ඉනිමක හා ලකුණු 81කින් පරාජය වුණ ශ්‍රී ලංකා පිළට මෙම දෙවැනි තරගයත් දැඩි අභියෝගයක් වනුයේ තරගාවලියේ රැඳී සිටීමට එනම් තරගාවලිය සම තත්ත්වයෙන් තබා ගැනීමට අවම ලෙස මෙම තරගය ජයගත යුතු බවත් අනෙක් තරගය ජය පරාජයෙන් තොරව නිමා කළ යුතු බවත්ය.

ජයග්‍රහණය කෙසේ වෙතත් මේ අවස්ථාවේදී ශ්‍රී ලංකා පිළ ටෙස්ට් තරගයක් ජය පරාජයෙන් තොරව දකුණු අප්‍රිකාවේදී නිමා කිරීම ලොකු ගෞරවයක් බව ක්‍රිකට් විචාරකයෙකු පැවසූ අතර එය එක්තරා අතකට නිවැරදි බවද පැහැදිලිය. දින තුනකටත් පසුවත් ප්‍රථම ටෙස්ට් තරගය නිමා කරනු ලැබූ ශ්‍රී ලංකා පිලේ දියාරු පිති හරඹය අඛණ්ඩව සිදුවුවහොත් ජය ගැනීම කෙසේ වෙතත් ජය පරාජයෙන් තොරව ඉදිරි ටෙස්ට් තරග දෙකද ගැන සිතීමට නොහැකිය.

මෙසේ හෙයින් ශ්‍රී ලංකාවේ පිතිකරණය ගැන දෙවරක් සිතිය යුතුය. තේරීම් කමිටු සාමාජිකයකු 'රිවිර' ට පැවසූවේ ක්‍රිකට් සංචිතයක් නම් කිරීමෙන් පසුව ආබාධයකට හැරුණ විට පිටතින් ක්‍රීඩකයින් ආදේශ කිරීමට නොහැකි බවයි. මෙය අප ද පිළිගන්නා සත්‍යයක් වුවද දකුණු අප්‍රිකාවේ සිටින 15 දෙනාගේ සංචිතයේ ප්‍රථම ටෙස්ට් තරගයට ක්‍රීඩා නොකරන ලද පිතිකරුවන් ගැන දෙවන ටෙස්ට් තරගයේදී සිතිය හැකිය. මෙහිදී ඉදිරියෙන්ම සිටිනුයේ නවක ක්‍රීඩක දිනේෂ් චන්දිමාල්ය. ඔහු නවකයෙකු ලෙස ලකුණු අතර දේශීය තරගවලද සිටින ක්‍රීඩකයෙකි. එහෙත් මෑතකදී ඔහුට නිත්‍ය ස්ථානයක් පිතිකරණයේදී නොදීම ඉතා අවාසනාවන්ත තත්ත්වයකි.

දක්ෂ පිතිකරුවෙක් මෙන්ම කඩුලු රකින්නෙකු ලෙසටද ක්‍රියාකර හැකි චන්දිමාල් එක්තරා අතකට කෞෂාල් සිල්වා වෙනුවට නම් කෙරෙන්නේ නම් මේ තත්ත්වය අනුව යහපත් ආදේශකයක් වනු ඇත. කෙසේ වුවත් නිත්‍ය ටෙස්ට් කඩුලු රකින ක්‍රීඩක ප්‍රසන්න ජයවර්ධනගේ අඩුව මෙම තරග සංචාරයේ තදින්ම දැනෙනුයේ ප්‍රබල ප්‍රතිවාදීන් සමග විශේෂයෙන් විදෙස් තණතිලිවල ප්‍රසන්න මැද පෙළට හොඳ ශක්තියක් වූ හෙයිනි.

තේරීම් කමිටුව තමන් කරනු ලැබූ තේරීම දකුණු අප්‍රිකානු තරගාවලියට පෙරම වැරදි බව පිළිනොගත්තද අවසන් මොහොතේ හෝ තිලාන් සමරවීර මහේලගේ ආබාධය ගැන මතුකර පෙන්නීමෙන් හෝ ඇතුළට ගැනීම කොතරම් හොඳ දැයි පෙනුණේ ප්‍රථම ටෙස්ට් තරගයේදී සෙන්චූරියන්හීදී සමරවීර මැද පෙළ ක්‍රීඩා කරමින් සෑහෙන මට්ටමකට කඩුල්ලේ රැඳී සිටි හෙයිනි. අනෙක් අන්තයෙන් පිතිකරුවන් එකාපිට එකා දැවී යද්දී සමරවීර දැඩි පීඩනයක් හමුවේ ක්‍රීඩා කරනු ලැබූ අයුරු ඉතා හොඳ වූ අතර දෙවැනි තරගයේදී ඔහු මීටත් වඩා දක්ෂතා දක්වනු ඇතැයි සිතීමට හැක්කේ ඔහුට පසුකාලීනව තරග අත්දැකීම් නොදීමට තේරීම් කමිටුව සමරවීර කණ්ඩායමෙන් නෙරපා ඇමූ හෙයිනි.

ප්‍රථම ටෙස්ට් තරගයට පෙර සුපිරි පිතිකරු කුමාර් සංගක්කාර අතේ ආබාධයක් ඇතිව යන්තම් සුවවීමෙන් ක්‍රීඩා කරනු ලැබූ අයුරු පැහැදිලි වූයේ ඉනිම දෙකේදීම ඔහු ඉමහත් අවිශ්වාසයකින් ක්‍රීඩා කිරීම හොඳින්ම ප්‍රදර්ශනය වූ හෙයිනි. සංගක්කාර, මහේල දෙදෙනාම ආබාධ ඇතිව ක්‍රීඩා කිරීම ගැන දෙවරක් සිතිය යුතුව ඇත්තේ මොවුන් දෙදෙනාට තව ඉදිරියේදී බොහෝ තරග ඇති හෙයිනි.

දෙවැනි තරගයට තරංග පරණවිතාන වෙනුවට ලහිරු තිරිමාන්න ගැනීමේ තැතක් ඇති බවට දකුණු අප්‍රිකාවෙන් ආරංචි වුවද එය තවමත් නිශ්චිත නැත. තිරිමාන්න හොඳ වුවද නවකයකු ලෙස දෙවැනි තරගයේදී දැඩි පීඩනයක් තුළ පහර දීමට සිදුවීම ගැටලුවකි. පරණවිතාන එකවර කණ්ඩායමෙන් ඉවත් කරන්නේ නම් එයද අනුමත කර නොහැක්කේ ඔහු තවදුරටත් ටෙස්ට් සඳහා පමණක් ලේබල් කර ඇති හෙයිනි.

**ධම්මික රත්නවීර**

දිමුත් කරුණාරත්න එක්දින තරගවලට මුලින් ගත්තද දැන් ප්‍රථම වරට ටෙස්ට් සංචිතයටද නම් වී ඇත. ඔහුට දිගටම බංකුවේ සිටීමට සිදුවේ නම් එයට පුදුම විය නොහැක්කේ බොහෝවිට චන්දිමාල්ටද මේ ඉරණම අත්වී ඇති හෙයිනි. තේරීම් කමිටුව කවිෂ්ක ඇල්විටිගල හා ධම්මික ප්‍රසාද්, නුවන් ප්‍රදීප් හා ඇන්ජලෝ මැතිව්ස්ට ආදේශයට යැව්වද දෙදෙනාටම අවස්ථාව දීම කියා සැක සහිතය. කෙසේ වුවත් කළමනාකරු අනුර තෙන්නකෝන් පවසනුයේ ප්‍රසාද් හා ඇල්විටිගල දකුණු අප්‍රිකානු තත්ත්වයට තවත් හුරුවිය යුතු බවයි. මේ වැකිය අනුව ඔවුන් දෙදෙනාට දෙවනි තරගයට ඉවත සිටීමටද පුළුවන.

සුරංග ලක්මාල් මෑතදී දක්ෂ ලෙස පන්දු යැව්වද ඔහු ආබාධිත ගොන්නට ගොස් ඇත. ශාමින්ද එරංගගේ අඩුවද දැනේ. ලසිත් මාලිංග ටෙස්ට් පිටියෙන් සමුගැනීමේ අඩුව මෙම දකුණු අප්‍රිකානු සංචාරයේදී තදින්ම දැනෙනු ඇත.

කෙසේ වෙතත් රංගන හේරත් පළපුරුදු හා දඟ පන්දු යවන්නට තවදුරටත් ස්ථානය ලැබේද ඒ වෙනුවට වේග පන්දු යවන්නන් සිව් දෙනෙකු ක්‍රීඩා කිරීමට දෙවෙනි තරගයේ පෙළඹේද යන්න හෙට (දෙසැ: 26) දැනගත හැකිය.

කෙසේ වුවත් දකුණු අප්‍රිකාව ප්‍රථම තරගය ජයගත්තද ශ්‍රී ලංකා පිළ අවතක්සේරු නොකොට වඩාත් කලින් සෙන්චූරියන් සිට ඩර්බන් බලා ගොස් පුහුණුවීම ශ්‍රී ලංකා පිළට හොඳ ආදර්ශයකි. ජැක් රුඩොල්ෆ් හා මෝන් මෝකල් අනෙක් ක්‍රීඩකයන්ට පෙර ඩර්බන් වෙත ගොස් පුහුණුවීම් ඇරඹූ බවට වාර්තා වේ. දෙසැ: 23දා පැමිණි මොවුන් දෙදෙනා පැති විකට්වල හොඳ පුහුණුවක් ලැබූ බව අනාවරණය වේ.

මේ අතර දකුණු අප්‍රිකානු වේග පන්දු බල ඇණිය ශක්තිමත් කිරීමට වමත් වේග පන්දු යවන්නෙකු ලෙස ලොන්වාබො සොත්සොබෙ දෙවෙනි ටෙස්ට් තරගයට කැඳවා ඇත. ඔස්ට්‍රේලියා ටෙස්ට් තරගාවලියේ ආබාධයට ලක්වූ සොත්සොබෙ පසුගිය නොවැ: 4න් පසුව පන්දු යවා නැත. මේ නවක වේග පන්දු යවන්නාගේ එක්වීම නිසා ඩේල් ස්ටේන් හා වර්නන් පිලන්ඩර් වෙත තවත් අමතර ජවයක් එක්වේ. විටක වෝකල් වෙනුවට සොත්සොබෙ ක්‍රීඩා කිරීමට හැකිය.

දකුණු අප්‍රිකානු වේග පන්දු යවන පුහුණුකරු ඇලන් ඩොනල්ඩ් පවසා ඇත්තේ ශ්‍රී ලංකා පිළට එරෙහිව හොඳම අවිය දකුණු අප්‍රිකානු වේග පන්දු බළඇණිය බවයි. එය තවත් ශක්තිමත් කළ යුතු බව ඩොනල්ඩ් ප්‍රකාශ කර ඇත.

කෙසේ වෙතත් ශ්‍රී ලංකා වේග පන්දු බළ ඇණියේ අත්දැකීම් ඇති පන්දු යවන්නන් නුවන් කුලසේකර, ශාමින්ද එරංග ආබාධයන් මත ඉවත් වී ඇත. නුවන් ප්‍රදීප් පෙරළා පැමිණ ඇත. ධම්මික ප්‍රසාද්ද එක්වනුයේ ආබාධයක් සුව වීමෙන් පසුවය. ඇල්විටිගල තවමත් ටෙස්ට් වරම් නොලැබූ ආධුනිකයෙකි. ශ්‍රී ලංකා වේග පන්දු පුහුණුකරු චම්පක රාමනායකට මෙය හොඳ අභියෝගයකි. එහෙත් පන්දු යවන්නන් පිතිකරුවන් දක්ෂතා අතර නැති විටදී පුහුණුකරුවන්ට චෝදනා කිරීම එක්තරා අතකට අසාධාරණය. ප්‍රතිඵල රහිතය. කෙසේ වුවත් පුහුණුකරුවන්ට හැක්කේ ක්‍රීඩකයන්ට යම් තල්ලුවක් දීම බවත් ජාතික තලයේ ක්‍රීඩකයෙකුට එතනින් එහාට දේ කළ හැකි බවත් 'රිවිර' ට අත්දැකීම් ඇති පුහුණුකරුවෙකු පැවසීමද සාධාරණය.

කෙසේ වෙතත් ජයග්‍රාහී මානසිකත්වය දැන් සකස් කරගත යුත්තේ ශ්‍රී ලංකා පිල පාකිස්තානයටද පහළට එනම් ටෙස්ට් ශ්‍රේණිගත කිරීමේ හයවැනි ස්ථානයට දැන් පහළට ගොස් ඇති හෙයිනි. ශ්‍රී ලංකාවට පහළින් සිටිනුයේ බ. ඉන්දීය කොදෙව්, නවසීලන්තය හා බංග්ලාදේශය පමණි.

මේ තත්ත්වය මුලින්ම ක්‍රීඩකයින් වටහා ගත යුතුය. එසේම පුහුණුකරුවන්ගේ හා ක්‍රීඩා බලධාරීන්ගේ දායකත්වයද අනිවාර්යෙන් ලැබිය යුත්තේ මේ තුනේ එක්වීමෙන් තොරව ඉදිරියට ගමන් කළ නොහැකි හෙයිනි.

## ක්‍රිකට් නිලවරණයට තව දින 9යි

# "කාටවත් වෙට්ටුදාලා දිනන්න මම කැමැති නැහැ"

## මොහාන් ද සිල්වා




ශ්‍රී ලංකා ක්‍රිකට් නිලවරණය ගැන උණුසුම් පුවත් දිනෙන් දින වැඩිවේ. නාම යෝජනා භාරගැනීම පසුගිය දෙසැ 19දා අවසන් වූ අතර ජනවාරි 3දා ක්‍රිකට් නිලවරණය පැවැත්වීමට නියමිතය.

නිසි බලධාරී ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් රංජනී ජයකොඩි පවසනුයේ නාමයෝජනා දීමෙන් පසුව සමහර අපේක්ෂකයන් සඳහා විරෝධතා මතුවී ඇති බවත් විශේෂ කමිටුවක අධීක්ෂණයෙන් පසුව නිලධාරීන්ට නිලවරණයට සුදුසු/නුසුදුසු බව තීරණය කරනු ලැබීමට නියමිත බවයි.

හිටපු සභාපති තිලංග සුමතිපාල නිලවරණයට නොපැමිණීම තීරණය කරනු ලැබූයෙන් සුමතිපාල පාර්ශ්වයේ ප්‍රධානත්වය ගෙන කටයුතු කරනුයේ තවත් හිටපු සභාපතිවරයකු වන මොහාන් ද සිල්වායි. මොහාන් මෙවර උප සභාපති තනතුරට ජයන්ත පරණාතල සමගින් සුමතිපාල පාර්ශ්වයෙන් තරග කිරීමට නියමිත අතර ධර්මදාස පාර්ශ්වයෙන් කේ.ජ්. මතිවානන් හා අසංග සෙනෙවිරත්න ද උප සභාපති ධූරයට තරග වදිති.

කෙසේ වුවත් මේ වන විට මතිවානන් හා අසංග සෙනෙවිරත්න වෙත විරෝධයක් ලිඛිතව ඉදිරිපත් කර ඇත්තේ මේ දෙපළ නිලවරණයට ඒමට ව්‍යවස්ථාවට පටහැනි හෙයිනි. මේ පිළිබඳව මොහාන් ද සිල්වා 'රිවිර'ට පැවසූයේ.

**ප්‍ර - ධර්මදාස පාර්ශ්වයේ නිලතල තුනක් සඳහා විරෝධයක් පැමිණ තිබෙනවා නිලවරණයට නුසුදුසු බවට. මේ ගැන ඔබේ අදහස.**

**පි** - ක්‍රිකට් ව්‍යවස්ථාවේ 11වන පරිච්ඡේදයේ S 5 කියන කොටස යටතේ විධායක කමිටුවට ඉදිරිපත් වන කෙනකු අඩුම ගණනේ වසර 2ක් වත් ක්‍රිකට් විධායක කමිටුවේ හෝ උප කමිටුවක සේවය කර යුතු බව සඳහන් වෙනවා. ඒ දිනවල මේ නීතිය ගේනවා. ක්‍රීඩා සමාජවලට පැරෂුට් එකෙන් ගේනවා වගේ උඩින් ගෙනත් මුදලාලිලා නිලවරණයට ගේන්න උත්සාහ ගත් නිසා. මේක නවත්වන්නැයි මෙවැනි නීතියක් ගෙනාවේ. අපිට අවශ්‍ය වෙලා තිබුණේ ක්‍රිකට්වලට සක්‍රියව සම්බන්ධ වී ඇති අයට මේ නිලවරණවලදී අවස්ථාව ලබාදීම. නිදසුනක් ලෙස 1969 ඉඳන් මම සිංහල ක්‍රීඩා සමාජයට සම්බන්ධ ක්‍රීඩාකර පරිපාලනයට ද සම්බන්ධ වී තමයි පියවරෙන් පියවර ක්‍රිකට් මුල් පුටුව තෙක් පැමිණියේ මයිකල් ද සොයිසාටත් අද වසර 40ක පමණ ඉතිහාසයක් තියෙනවා. මේ අත්දැකීම් ඉතා වැදගත් ක්‍රිකට් ආයතන පරිපාලනයට.

අපට අවශ්‍ය නැහැ කවුරුවත් ප්‍රතිවාදියෙක් තරග කරන එක නැවැත්වීමට. අතුරු කමිටු තමයි පසුගිය වසර 7 තුළ තිබුණේ. ඡන්දයක් පැවැත්වූයේ නැහැ. අවස්ථාවක් තිබුණෙ නැහැ ක්‍රිකට් ක්‍රීඩා සමාජවල අයට විධායක මණ්ඩලයේ සේවයට. මේ නිසා මේ නීතිය වැදගත්. මේ නිසා නීතියක් ස්ථාපිත වෙලා ඇති විට එම නීතියට පටහැනිව ඒම වරදක්.

**ප්‍ර - ඔබගේ පාර්ශ්වයේ කිසි කෙනෙකු මේ නීතියට පටහැනිව නිලවරණයට ඉදිරිපත් වී නැද්ද?**

**පි** - මම දන්න තරමට නැහැ

**ප්‍ර - කෙනෙකු කිව්වොත් ඔබලා විරෝධය දක්වන්නේ මතිවානන්, අසංග වගේ අය ඡන්දයෙන් දිනාවි කියන බයට නිසා.**

**පි** - මම හැමදාම කියන දෙයක් තමයි ජයග්‍රහණය භුක්තිවිඳින්න පුළුවන් හරි ජයක් වුණොත් විතරයි කියා. අනික් අයට වෙට්ටු දමා කකුල්මාට්ටු දමා ජය ලබන්න කැමැති කෙනෙක් නොවේ. මේ නිසා මේ චෝදනාව මට කරන්න බැහැ. මම එක අතකින් කැමැතියි ඇමැතිතුමා මොවුන්ට අනුමැතිය දී තරගයට එනවා නම්.

**ප්‍ර - ඇමැතිතුමා හරහා චෝදනා ලැබූ අය නිදොස්ව තරගෙට එන බවට රාවයක්ද යනවා**

**පි** - ඇමැතිතුමාගේ තීරණයත් ගනීවි. සොයාබලා තීරණය කරනවා ඇති සුදුසු බව.

අපිට කරන්න කිසිදෙයක් නැහැ. අපි කරන්නෙ ඡන්දයට ඉදිරිපත් වීම පමණයි.

**ප්‍ර - මතිවානන් හා අසංග දෙදෙනා දිනුවොත් ඔබලා නැවත විරෝධය දක්වනවද නිලවරණයෙන් පසුව**

**පි** - මම දන්නවා අනිවාර්යයෙන්ම නීති මාර්ගයෙන් ක්‍රියා කරාවි. නැත්නම් මෙම වැරදි වැඩේ ඉදිරියටත් සිදුවේවි. ඒ නිසා නීතියෙන් වැඩක් නැති වේවි. අපේ ජය පැරදුම කෙසේ වෙතත් නීතියක් තිබේ නම් එය එලෙසම ක්‍රියාත්මක විය යුතුයි. අපි කිසිදා නීතියට පිටින් ක්‍රියා කර නැහැ. නීතියට ගරු කරනවා. අපි තෝරාගත් අයට කිසිම ගැටලුවක් තාම නැහැ.

**ප්‍ර - තිලංග පවසනවා ඡන්දෙට නොපැමිණියත් එයා විධායක කමිටුවේ ඉන්න බව. ඒත් තවත් මතයක් තියෙනව අන්තිමට සභාපති වුණ ඔබටයි ඒ අවස්ථාව තියෙන්නෙ කියා.**

**පි** - ඒකත් මේ වෙලාවෙ විවාදයට තුඩු දෙන කරුණක්. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය නිදහස් තැනක්. මේ නිසා පැවසිය යුතුයි අවසන් නිලවරණයෙන් නිලධාරීන් තේරුණා. එහිදී තිලංග ඇතුළු පිරිස සති 2ක් විතර වැඩ කළා. පසුවයි මේ තත්ත්වය වුණේ .ඇත්තටම එදා බලෙන් තමයි ක්‍රිකට් ආයතනයේ බලය ලබාගත්තේ. උසාවි ගියාම ඔවුන් පිළිගත්තා ක්‍රිකට් ආයතනය අයිති රජයට නොව එය ස්වාධීන ආයතනයක් බවට.

**ප්‍ර - ඔබ සුමතිපාල පාර්ශ්වයේ දැන් ප්‍රධානියා, ඔබට විශ්වාසයක් තියෙනවද කණ්ඩායමේ හැමෝටම දිනන්න පුළුවන් බවට?**

**පි** - හැමෝටම කියන්න බැහැ. ඒත් බහුතරයක් අනිවාර්යයෙන්ම දිනනවා.

**ප්‍ර - මේ අනුව තව කොටසක් ධර්මදාස පාර්ශ්වයෙන්ද දිනා බලයට එනවා. මත 2ක කොටස් දෙකකට එකට වැඩ කරන්න පුළුවන්ද?**

**පි** - මේ අවස්ථාවේ පිළිගන්න ඕන ක්‍රිකට්වලට ඇල්මක් ඇති පරිපාලකයො ලෙස ක්‍රිකට්වලට වෙලා ඇති දේ මේ ගැන කළ කිරීමකින් හිටිය බව. අපි වසර 2කට කලින් මත පළකරා මේ තත්ත්වයම එන බවට. එදා අපි මෙය මාධ්‍යයෙන්ද පැවසුවා. මේ තත්ත්වය අලුතෙන් පත්තුවූයේ හිටපු නායක කුමාර් සංගක්කාර එංගලන්තයේදී කරනු ලැබූ දේශනයත් සමග. මිනිස්සු එදා ගණන් ගත්තෙ නැහැ. නමුත් අපිට එදා හඬක් නැගීමට අවස්ථාවක් නැහැ. අද ඡන්දයට කථා කරාම ආනා පුංචිහේවා, මම, තිලංග, පී.අයි. පීරිස් හා උපාලි ධර්මදාස අපි පස්දෙනා තමයි දැනට හිටපු සභාපතිවරු ලෙස ඉතිරිව ඉන්නෙ. පී.අයි.පීරිස් අසනීපයි. අපි තුන්දෙනා ආනා, මම, තිලංග සාකච්ඡා කරා උපාලි මුලින්ම පැවසුවා සභාපති ලෙස ඡන්දයට එන බව. ඔහු එන කණ්ඩායමට සිදත් වෙත්තමුණි, අසංග සෙනෙවිරත්න වගේ අය ඉන්න බව කිව්වා. අතුරු කමිටුවල හිටිය මේ අයත් ක්‍රිකට් පරිහානියට වගකිව යුතුයි. සමහර අය හිතන්නෙ ක්‍රිකට් ගහලා තියෙන අය හොඳ පරිපාලකයන් කියා. ඒත් එහෙම නැහැ. ඒ අය බලයට පැමිණ මොනවද කළේ. අතුරු කමිටුවල ඒ අය මොකක්ද කළේ.

**ප්‍ර - ඔබලා බලයට පත්වීමෙන් එන පිලට දේශපාලන අතපෙවීමක් සිදුනොවෙයි කියා හිතනවද?**

**පි** - මම හිතන්නේ අපිට ශක්තිය තියෙනවා. අපි හරි දේ කරන්න ඉදිරිපත් වෙනවා. අපිට පේනවා නම් හරි දේට අකුල් හෙලනවා කියා අපි වැඩ කරන්නේ නැහැ. අපි අයින් වෙනවා. හරි දේ ක්‍රිකට්වලට හා රටට කිරීමටයි අපිට ඕන.

**ප්‍ර - උපාලිගේ බලාපොරොත්තුවක් තියෙනවා රජයෙන් සහාය ලබා ක්‍රිකට් ගොඩනගන්න. ඒත් තිලංග කියන්නෙ රජයෙන් යැපෙන්න ඕන නැහැ. සල්ලි හොයාගෙන කර යුතුයි කියා. තිලංග අද බලයට එන්නෙ නැහැ. මේ නිසා ඔබේ මතය කුමක්ද?**

**පි** - අපිට හැමෝගෙම සහාය අවශ්‍යයි ආණ්ඩුවෙ සල්ලි අවශ්‍ය නැහැ කියා කියන්න බැහැ. ඒත් අපි දන්නවා රජයෙ සල්ලි නැතුවත් මෙය පවත්වාගෙන යන්න. අපිට ඒකට සැලසුමක් තියෙනවා. නමුත් අපි දන්නවා රජයෙන් තමයි ක්‍රීඩාංගණවලට ලොකු මුදලක් වැය කළේ. ඒ නිසා ආණ්ඩුවට පුළුවන් නම් යම් කොටසක් හෝ දෙන්න. ඒ මුදල් අපි පිළිගන්නවා. හැබැයි එය අනිවාර්යයෙන් බලාපොරොත්තු වෙන්නෙ නැහැ. ඒත් අපි දන්නේ නැහැ පාලන බලයට ගන්න කලින් ඇත්ත තත්ත්වය ආයතනය තුළ. කොහොමත් හොඳ සැලසුමකින් යනවා. අර්බුදය මාස 3 - 6ක් කාලයකට එයි. ඊට පස්සෙ ක්‍රීඩා සංචාර පටන් ගන්න කොට සල්ලි එයි. ඒත් මම දකින අන්දමට අවුරුදු 2ක් වත් යාවි සම්පූර්ණයෙන්ම මේ ගැටලු විසඳීමට පුළුවන් වේවි. මෙහිදී අපේ ජාත්‍යන්තර සම්බන්ධතා අනුවයි මේක විසඳන්නෙ. අතුරු කමිටුවල කිසිවකුට සහාය නොදුන්නේ ස්ථාවරයක් නැති නිසා. ඒත් ඡන්දයකින් ආවොත් ඒ තත්ත්වය නැහැ. අද උපාලිටත් පිළිගැනීමක් තියෙනවා. දේශීය හා ජාත්‍යන්තරව ඔවුන් සමග එක්වී මේ නිසා අපට පාලනය කරන්න හැකි වේවි. මොහාන් පැවසීය.



මොහාන් ද සිල්වා මාධ්‍යයට අදහස් දක්මින් (ඡායාරූප - චන්දන විජේසිංහ)

සංවාද සටහන
**ධම්මික රත්නවීර**
dhammikaratna@gmail.com

# "දැල්පන්දු රැජින ලෙස කිරුළ ලැබීම මගේ විශ්වාසය වැඩි කළා"

## ගයාත්‍රි ලංකාතිලක

ශ්‍රී ලංකාව දැල්පන්දු ක්ෂේත්‍රයේ ආසියානු කිරුළ හිමිකම් කියන නිසා ක්‍රිකට් ක්‍රීඩාවට පසුව අපට වැඩිපුර ආඩම්බරයෙන් කතා කිරීමට හැකිය. අවසන් වරට ආසියානු ශූරයන් වූ ශ්‍රී ලංකා පිලට එළඹෙන වසරේ නැවතත් ලංකාවේ පැවැත්වෙන ආසියානු දැල්පන්දු ශූරතාවලිය ලොකු අභියෝගයක් වන්නේ සත්කාරකත්වය ද සමගින් අමතර පීඩනයක් ද නිතැතින්ම ඇතිවන හෙයිනි.

දැල්පන්දු ගැන කතා කිරීමේ දී අපේ රටේ වැදගත්ම හා ගුණාත්මක බවින් වැඩිම තරගාවලිය ජාතික දැල්පන්දු තරගාවලිය පසුගිය දා නිමාවට පත් වූයේ සෙලාන් බැංකුව හැටන් නැෂනල් බැංකුව අබිබවා ශූරතාව ලබා ගනිමිනි. ඒත් දක්ෂතාව නිසාම පරාජිත HNB පිලේ පළපරුදු ක්‍රීඩිකා ගයාත්‍රි ලංකාතිලක දැල්පන්දු රැජන ලෙස අභිෂේක ලැබීම විශේෂත්වයකි.



මෙහි සුවිශේෂී බවක් උසුලන්නේ ජාතික දැල්පන්දු තරගාවලි ඉතිහාසයේ 12 වැනි වරටත් දැල්පන්දු රැජන ලෙස ගයාත්‍රි අභිෂේක ලැබීම ය. 'Netball Queen' වීමේ සිහිනය නැවතත් ලැබූ ගයාත්‍රි 'රිවිර' සමග සාකච්ඡාවට පැමිණියේ තමා කෙටි කලක් පසුගිය දා එංගලන්තයේ සංචාරය කරමින් තවදුරටත් අත්දැකීම් ගැනීමෙන් ද තමාගේ ක්‍රීඩා දිවියට පිටිවහලක් වූ බව පවසමිනි.

ඇත්තටම දැල්පන්දු රැජන වීම ලොකු සතුටක්. වසර 2000දීත් මම මේ කිරුළ ලැබුවා. මගේ දක්ෂතාවන්ට නියම ඇගයීමක් ලැබීම සතුටක් බව ගයාත්‍රි ප්‍රකාශ කළාය. ඒත් අපේ පිල ශූරතාව ලැබුවා නම් මේ සතුට තවත් වැඩි වන බව ද ඇය පැවසුවාය.

"සාමාන්‍යයෙන් පරාජිත පිලක ක්‍රීඩිකාවකට දැල්පන්දු රැජන වෙන්න අමාරුයි. මේ නිසා මෙවර මේ ලැබූ සම්මානය මට ගොඩාක් විශේෂයි. ඒ ගැන අවංකවම ආඩම්බර වෙනවා." යැයි ගයාත්‍රි පැවසුවාය.

"ඇත්තටම මෙවර ජාතික තරගාවලියේ දී HNB පිලේ හිටියේ පරිණත ක්‍රීඩිකාවන්. වයස අවුරුදු 30ට වඩා ක්‍රීඩිකාවන් සියල්ලම ක්‍රීඩා කළේ යොවුන් ක්‍රීඩකයන් බහුල සෙලාන් බැංකු පිල සමග. ප්‍රතිවාදීන්ට වඩාත් උස තර්ජනී ශිවලිංගම් නිසා වැඩි වාසියක් නිතැතින්ම හිමි වුණා. සොමිතා ද අල්විස් HNB පුහුණුකාරිය ඉතා හොඳින් තම කාර්යය ඉටු කළා. කුමරින් ද සිල්වා පැසිපන්දු ක්‍රීඩිකාවක් වුණත් ශ්‍රී ලංකා පිලට දැල්පන්දු නායකත්වය ද දරමින් ක්‍රීඩා කළේ සොමිතා අක්කාගේ දක්ෂ පුහුණුකාරිත්වය තුළ. මේ නිසා අවුරුදු 13ක් අඛණ්ඩව HNB ජාතික ශූරතාව දිනුවා. ගිය වසරේ තමයි අපේ ආධිපත්‍ය ජාතික තරගාවලියේ බිඳ වැටුණේ. ඒත් මෙවරත් අපි හොඳ සටනක් දීම සතුටු වෙනවා." යැයි ගයාත්‍රි පැවසුවාය.

"මගේ අත්දැකීම් අදටත් ගොඩක් හොඳින් ක්‍රීඩාවේ යෙදෙන්න පුළුවන් වීමට බලපා තියෙන්නේ. එංගලන්තයේ ප්‍රථම වරට මට ක්‍රීඩා සමාජයකට ක්‍රීඩා කරන්න හැකි වුණා. ලංකාවට වඩා එංගලන්ත අන්තර් සමාජ ක්‍රීඩා තරගවල තත්ත්වය ගොඩක් වැඩියි. මේක අපට ලොකු වාසියක්. අපේ බැංකුව මගේ මේ කෙටි සංචාරයට යෑමට අවස්ථාව දීම සතුටක්. මේ නිසා HNB නිලධාරී මඩුල්ලට කෘතවේදීත්වය දැක්විය යුතුයි. එදා සිටම HNB සහාය මට හොඳින්ම ලැබෙනවා.

"ඉදිරියේ දී ඔස්ට්‍රේලියානු විශේෂඥ පුහුණුකාරියක් එන්න හදනවා අපේ පුහුණුවීම්වලට. මේක හොඳ දෙයක්. අපේ අඛණ්ඩ පුහුණුවීම් විදෙස් පුහුණුකාරිය හා දේශීය පුහුණුකාරිය සමග සිදු කළොත් නැවතත් ආසියානු කිරුළ රැක ගැනීමට හැකි යැයි ගයාත්‍රි පැවසුවාය. වත්මන් දැල්පන්දු පරිපාලනයට ලොකු වගකීමකින් වැඩ කරනවා. ඒක සතුටක්." ඒ නිසා ක්‍රීඩිකාවක් ලෙස උපරිමය කර ප්‍රතිඵල නෙළා ගැනීමට උත්සාහ කරන බව ද ගයාත්‍රි පැවසුවාය.

**ධම්මික රත්නවීර**
**ඡායාරූපය-ශ්‍රීමාල් කංකානම්ගේ**

# ජනසතු සේවා ප්‍රවීණ කැරම් ශූරතාවය සූරිය කුමාරට



ජනසතු සේවා කැරම් සංගමය මෙහෙයවන ලද 2011 වසරේ ප්‍රවීණ හා මිශ්‍ර යුගල කැරම් ශූරතාවලියේ ප්‍රවීණ කැරම් ශූරතාව දිනා ගැනීමට ලේක් හවුස් ආයතනයේ එච්.පී. සූරියකුමාර සමත් විය. (19/16, 22/24, 25/14) අනුශූරතාව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ ආර්.ඒ.එස්.එච්. රණසිංහට හිමි විය.

මෙම කැරම් ශූරතාවලිය පසුගිය දා ලංකා බැංකු ක්‍රීඩා සමාජ පරිශ්‍රයේදී පවත්වන ලදී.

ලංකා ගමනාගමන මණ්ඩලයේ ආර්.ඒ.ජේ. වික්‍රමසිංහ, එච්.එම්.කේ.කේ. හේරත් සමග එක්ව මිශ්‍ර යුගළ ශූරතාව දිනාගත් අතර (25/24, විඝ්න/25, 22/16) අනුශූරතාව ලංකා විදුලිබල මණ්ඩලයේ එම්.සී. ආරියවංශ සමග එක්ව ආර්.කේ. යශිකා රාහුබද්ධ විසින් හිමි කර ගන්නා ලදී.

ප්‍රවීණ කැරම් ශූරතාවලියේ අවසන් තරගයේදී එච්.පී. සූරිය කුමාර, ආර්.ඒ.එස්.එච්. රණසිංහ සමග තරග කළ අවස්ථාවයි.

සීමාසහිත රිවිර මීඩියා කෝපරේෂන් (පෞද්ගලික) සමාගම විසින් කොළඹ 10, මාලිගාවත්තේ අංක 249/2 තැන පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.